# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

**අංක 2455/03 – 2025 සැප්තැම්බර් මස 22 වැනි සඳුදා – 2025.09.22**

**(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)**

# I වැනි කොටස: (I) වැනි ඡෙදය – සාමාන්‍ය

## රජයේ නිවේදන

මගේ අංකය: IR/COM/01/2018/211.

**කාර්මික ආරාවුල් පනත – 131 වන අධිකාරය**

131 වන අධිකාරය වන සංශෝධිත කාර්මික ආරාවුල් පනතේ 4(1) වගන්තිය යටතේ 2024.02.28 දිනැති හා අංක 2373/29 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *අති විශෙෂ ගැසට් පත්‍රයේ* ප්‍රසිද්ධ කරන ලද 2024.02.21 දින දරන නියෝගයෙන්,එක් පාර්ශ්වයක් වශයෙන් 1. සියඹලාපේ, මීගහවත්ත, දේවාල පාර, අංක 65/7/8 ලිපිනයෙහි පදිංචි ජී.එල්.නිමල් වීරසිරි මහතා 2. රාජගිරිය, මාදින්නාගොඩ, 714/ඩී, පදිංචි පී.කේ.ප්‍රියන්ත සූරසේන මයා ඇතුළු සේවකයින් 11 දෙනෙක් සහ අනෙක් පාර්ශ්වය වශයෙන් කොළඹ 13, බ්ලූමැන්ඩල් පාර, අංක 223 හි පිහිටි උපාලි නිව්ස්පේපර්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් අතර පවත්නා කාර්මික ආරාවුල බේරුම් කිරීමෙන් සමථයකට පත් කිරීම සඳහා යොමු කරන ලදුව, බේරුම්කරු විසින් මා වෙත එවා ඇති අංක A/09/2024 හා 2025.08.07 දිනැති ප්‍රදානය එම පනතේ 18(1) වගන්තිය යටතේ මෙයින් ප්‍රකාශයට පත් කරනු ලැබේ.

**එච්. එම්. ඩී. එන්.කේ.වටලියද්ද,**
කම්කරු කොමසාරිස් ජනරාල්.

2025 සැප්තැම්බර් මස 08 වැනි දින.
කම්කරු දෙපාර්තමේන්තුව
කොළඹ 05.



*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

කොළඹ බේරුම්කරණ හා කාර්මික අධිකරණ ශාඛාව.

ආරාවුල් අංකය - IR/COM/01/2018/211
බේරුම්කරණ අංකය - A/09/2024

1. පී.එල්.නිමල් වීරසිරි මහතා,
අංක 65/7/8, දේවාල පාර,
මීගහවත්ත,
සියඹලාපේ.

2. පී.කේ.ප්‍රියන්ත සූරසේන මයා
අංක 714/ඞී,
මාදින්නාගොඩ,
රාජගිරිය.
(ඇතුළු සේවකයින් 11 දෙනෙක්)

*පළමු පාර්ශ්වය*

සහ

උපාලි නිව්ස්පේපර්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්,
අංක 223,
බ්ලූමැන්ඩල් පාර,
කොළඹ 13.

*දෙවැනි පාර්ශ්වය*

අතර පවත්නා කාර්මික ආරාවුල,

**ප්‍රදානය**

කම්කරු හා විදේශ රැකියා අමාත්‍ය මනුෂ නානායක්කාර මැතිතුමා විසින් 1957 අංක 14 හා 1957 අංක 62 හා 1962 අංක 4 හා 1968 අංක 39 (1968) අංක 37 දරන කාර්මික ආරාවුල් (විශේෂ ප්‍රතිපාදන) පනත සමඟ කියවා) දරන පනත් වලින් සංශෝධිත වූ ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956) ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනතේ 4(1) වන වගන්තියෙන් ඔහු වෙත පැවරී ඇති බලතල අනුව, එකී ආරාවුල බේරුම් කිරීමෙන් නිරවුල් කිරීම සඳහා බේරුම්කරු වශයෙන් මා පත්කොට මා වෙත යොමු කර ඇත.

ඉහත සඳහන් පාර්ශ්වයන් අතර ඇති කාර්මික ආරාවුලට හේතු වී පවත්නා කරුණ වනුයේ,

“ උපාලි නිව්ස්පේපර්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් ආයතනයේ වර්ෂ 10 කට වැඩි කාලයක් සහිතව විශ්‍රාම යන සේවකයන්ට වර්ෂයකට මසක වැටුප පදනම් කර පාරිතෝෂික ගෙවීමේ ක්‍රමය වෙනස් කර වර්ෂයකට මාස භාගයක වැටුප පදනම් කර පාරිතෝෂික ගෙවීම නිසා පහත නම් සඳහන් සේවකයින් 11 දෙනාට යම් අසාධාරණයක් සිදුව තිබේද යන්න හා එසේ අසාධාරණයක් සිදුව තිබේ නම් ඔවුන්ට හිමිවිය යුතු සහන කවරේද යන්නත් පිලිබඳව වේ. ”

1. ජී. එල්. එන්. වීරසිරි මයා.
2. පී.කේ. ප්‍රියන්ත සූරසේන මයා
3. ජේ. ඒ. යූ. බී. සේරම් මයා
4. එස්. ඒ. බී. සමරවීර මයා
5. යූ. සරත් කුමාර මයා.
6. යූ.ඩී. සනී ස්ටැන්ලි මයා.
7. එච්. ඒ. යූ. අයි. අමරසේන මයා
8. එස්. බී. වයි. එස්. කුමාරසිංහ මයා
9. අළුත්ගේ වසන්ත උපනන්ද මයා
10. ජී. සරත් කුමාර මයා
11. කේ. ජී. යූ. පී. කුමාර මයා

පැමිණිලිකාර පලමු පාර්ශ්වය වන ඉහත සඳහන් සේවකයින් 11 දෙනා උපාලි නිවුස්පේපර්ස් ලිමිටඩ් ආයතනයේ වසර 28 සිට වසර 38 දක්වා කාල පරාසයක් තුල සේවය කොට විශ්‍රාම ලබා ඇත.මෙම සේවකයින් සේවයේ යෙදී සිටි කාලය තුල එකී ආයතනයේ සේවය කොට විශ්‍රාම ගත් සේවකයන්ට පාරිතෝෂික ගෙවීම් පනතේ 10 වගන්තිය යටතේ වැඩි වාසි දායක පාරිතෝෂිකයක් එනම් සේවයේ යෙදී සිටි එක් වර්ෂයක් සඳහා අවසන් වරට ලැබූ වැටුප මත මාසය බැගින් ගණන් බලන ලද පාරිතෝෂිකයක් ගෙවා ඇත. එහෙත් පැමිණිලිකාර පලමු පාර්ශ්වය වන ඉහත සඳහන් සේවකයින් 11 දෙනාට එකී ක්‍රමයෙන් බැහැරව පාරිතෝෂික ගෙවීම් පනතේ 5 වගන්තිය යටතේ නියම කර ඇති ආකාරයට සේවයේ යෙදී සිටි එක් වර්ෂයක් සඳහා අවසන් වරට ලැබූ වැටුප මත මාස භාගයක වැටුප බැගින් ගණන් බලන ලද පාරිතෝෂිකයක් ගෙවා ඇත.

වඩා වැඩි වාසිදායක පාරිතෝෂිකයක් ලබා ගැනීම සඳහා අවශ්‍ය සියලුම සුදුසුකම් සපුරා තිබියදී එකම සේවා යෝජකයා විසින් එකම ආයතනයක සේවයේ යොදවා සිටි එකම ආකාරයේ සේවකයින්ට වෙනස් කොට සැලකීම මගින් දෙවන පාර්ශ්වයට අසාධාරණයක් සිදුකර ඇති බව කියාසිටී. වඩාත් වාසිදායක පාරිතෝෂිකයක් අනිකුත් සේවකයන්ට ලබා දීම නිසා පලමු පාර්ශ්වයේ සේවකයන් තුල තමන්ටද ඒ ආකාරයේ වාසිදායක ව්‍යවස්ථාපිත හිමිකමක් ලැබෙනු ඇතැයි යන නීත්‍යානුකූල අපේක්ෂාවක් ඇතිකර දෙවන පාර්ශ්වය විසින් එය අහිමි කිරීමට කටයුතු කිරීම අසාධාරණ හා අයුක්ති සහගත බවද කියා සිටී. දැනටමත් දෙවන පාර්ශ්වය විසින් පලමු පාර්ශ්වයට සේවය කරන ලද එක් එක් වර්ෂයට මාස භාගයක වැටුප ගණන් බලා පාරිතෝෂික වශයෙන් ගෙවා ඇති බවත් එය වැරදි ගණනයක් බවත් සේවය කරන ලද එක් වර්ෂයට මසක වැටුප ගණන් බලා ගෙවීම පැහැර හැර ඇති හිඟ මුදල් තමන්ට අයකර දෙන ලෙස නියෝගයක් ලබා දෙන ලෙසත් ඉල්ලා සිටී.
දෙවන පාර්ශ්වය වෙනුවෙන් ප්‍රකාශ කරනුයේ තම සේවකයින්ට

a. 1983 අංක 12 දරන පාරිතෝෂික ගෙවීම් පනතේ 5 (1) සහ 6 (2) වගන්ති ප්‍රකාරව කම්කරුවා අන්තිමට ලබාගත් වැටුපෙන් භාගයක් එම කම්කරුවා සේවය කල වසර ගණනින් වැඩි කර එම මුදල එකී කම්කරුවාගේ පාරිතෝෂිකය වශයෙන් ගෙවනු ලබන බවයි.

b. ඊට අමතරව, Ex Gracia එනම් ත්‍යාගයක් ලෙස, නීතිමය යුතුකමක් නොමැති ලබාදීමක් ලෙස කම්කරුවෙකු විසින් අන්තිමට ලබාගත් මාසික වැටුපෙන් භාගයක් එම කම්කරුවා සේවය කල අවුරුදු ගණනින් වැඩිකර ලැබෙන මුදල ගෙවීමද සිදු කරනු ලබන බවයි.

තවද Ex Gracia එනම් ත්‍යාගයක් ලෙස එනම් නීතිමය යුතුකමක් නොමැති ලබාදීමක් ලෙස ගෙවීම කරනු ලබන්නේ ආයතනයේ ලාභාංශ වැඩි අවස්ථා වලදී බවද එම ගෙවීම සිදුකරන ලද්දේ කිසිදු සාමූහික ගිවිසුමක් හෝ වෙනත් යම් ගිවිසුමකින් තොරව බවද කියා සිටී. ඒ අනුව ආයතනය පාඩු ලබන්නට පටන් ගත් විට Ex Gracia ගෙවීම නතර කල බවද කියා ඇත. එම තීරණය නීති විරෝධී නොවන බවද කිසිම කම්කරුවෙකුගේ අයිතිවාසිකමක් උල්ලංඝනය නොකරන ලද බවද කියා සිටී. තවදුරටත් කරුණු දක්වමින් කියා සිටිනුයේ 1983 අංක 12 දරන පාරිතෝෂික ගෙවීම් පනතේ වඩාත් වාසිදායක පාරිතෝෂික ගෙවීම පිළිබඳව සඳහන් නොමැති බවයි. ආයතනය විසින් (සේවකයා වැඩකල වසර ගණන X මාස භාගයක වැටුප ) Ex Gracia දීමනාවක් ගෙවා ඇති නමුත් එය 1983 අංක 12 දරන පාරිතෝෂික ගෙවීම් පනතේ 10 (1) යටතේ ලබා දිය යුතු පාරිතෝෂික දීමනාවක් නොවන බවයි. ආයතනය ලාභ ලබන අවස්ථාවල දී

Ex Gracia ගෙවීමක් සිදුකර ඇති අතර එය සිදුකර ඇත්තේ සාමූහික ගිවිසුමක් හෝ වෙනත් ගිවිසුමක් මත නොවන බැවින් පලමු පාර්ශ්වයට නීත්‍යානුකූල අපේක්ෂාවක් (Legitimate Expectation) ඇතිවීමට කිසිදු හේතුවක් නොමැති බවයි. තවද, IR/COM/04/2017/44 ආරාවුල සම්බන්ධයෙන් ලබාදුන් ප්‍රදානය මගින් මෙම බේරුම්කරණය බැඳී නැති බවත් මෙම ආරාවුල වෙනම ගැටලුවක් ලෙස සලකා ස්වාධීනව කටයුතු කළයුතු බවත් කියා සිටී.

සේවකයින්ට නීත්‍යානුකූලව ගෙවීමට අමතරව ලබා දුන් Ex Gracia මුදල කිසිදු සාමූහික ගිවිසුමකින් හෝ වෙනත් ගිවිසුමකින් තොරව ගෙවන ලද මුදලක් බවද කියා සිටින අතර එසේ හෙයින් පාරිතෝෂික ගෙවීම සම්බන්ධයෙන් කිසිදු කාර්මික ආරාවුලක් පැන නැගී නොමැති බවත් පලමු වැනි පාර්ශ්වය කර ඇති ඉල්ලීම සාධාරණ හා යුක්ති සහගත නොවන බවත් පැමිණිල්ල නිෂ්ප්‍රභා කරන ලෙසත් අයැද සිටී.

මෙම නඩුව විභාගයට ගත් අවස්ථාවේ දී දෙවන පාර්ශ්වය විසින් විසඳුමක් වශයෙන් සමස්ථ යෝජනාවක් ඉදිරිපත් කරන ලදී. එම සමථය වන්නේ පලමු පාර්ශ්වය ඉල්ලා ඇති 100% මුදලින් 75% ක් ගෙවීමට සූදානම් බවත් දැනටමත් 50%ක් ගෙවා ඇති හෙයින් ඉතිරි 25% ප්‍රමාණය ගෙවීමට සූදානම් බවයි. පලමු පාර්ශ්වය එම සමථ යෝජනාව සඳහා එකඟ නොවන බව දන්වන ලද බැවින් මෙම ආරාවුල විභාගය සඳහා ගන්නා ලදී.

ඉල්ලුම්කරුවන්ගේ සේවා යෝජකත්වය, ඔවුන් දරන ලද තනතුරු, අවසන් වරට ලැබූ වැටුප හා සේවා කාලය ආදී කරුණු පිළිබඳව හබකිරීමක් සිදු නොවීය. සියලු ඉල්ලුම්කරුවන්ගේ ඉල්ලීම නඩු නිමිත්ත හා විසඳිය යුතු කාරණය සමාන බවට එකඟ වූ හෙයින් සියලු නඩු එක්ව සලකා බැලීමටත් ඉල්ලුම්කරුවන්ගේ මූලික සාක්ෂිය දිවුරුම් ප්‍රකාශ මගින් ගොනු කිරීමටත් තීරණය කරන ලදී.

දිවුරුම් ප්‍රකාශ ලබාදුන් ඉල්ලුම්කරුවන් අතරින් සමරවීර ආරච්චිගේ බන්දුල සමරවීර යන අය නඩුව අතරතුරදී මිය ගිය හෙයින් ඔහුගේ දිවුරුම් ප්‍රකාශය මත හරස් ප්‍රශ්න විමසීමක් සිදු නොවීය.

පලමු සාක්ෂිකරු වශයෙන් ගම්මැද්දගොඩ ලියනගේ නිමල් වීරසිරි යන අය කැඳවන ලදී. ඔහු තම දිවුරුම් ප්‍රකාශයේ මෙසේ කියා ඇත. මම උපාලි නිවුස්පේපර්ස් ලිමිටඩ් ආයතනයේ සේවයට බැඳුනේ 1987.11.01 දිනයි. 2010 වසරේ සිට වැඩ පරීක්ෂකවරයෙක් ලෙස උසස් වීමක් ලැබුනා. මම 2017.12.16 දින රැකියාවෙන් විශ්‍රාම ගත්තා. ඒ වන විට මා වසර 30 එම ආයතනයේ සේවය කර තිබූ අතර අවසන් වරට මා ලැබූ මාසික වැටුප රු. 37,585/= කි. විශ්‍රාම ගැනීමෙන් පසු මට රු 563,775/=ක පාරිතෝෂික මුදලක් ලැබුනා. එම මුදල මා වෙත ලැබිය යුතු මුදලින් 50% ක් පමණයි. ඉතිරි 50% කොටස පසුව ලබා දෙන බව කළමණාකාරිත්වය විසින් මා හට දැනුම් දුන්නා. සාමාන්‍යයෙන් උපාලි නිවුස්පේපර්ස් ලිමිටඩ් ආයතනයේ සේවය කර විශ්‍රාම ගන්නා සේවකයන් වෙත ඔවුන් සේවය කළ එක් එක් සේවා වර්ෂයක් වෙනුවෙන් එම සේවකයා අවසන්වරට ලැබූ මාසික වැටුප අනුව එක් මාසයක් පදනම් කර ගනිමින් සමස්ථ සේවා කාලය සඳහා ගණන් බලනු ලබන පාරිතෝෂිකයක් ගෙවනු ලබන බව මා දැන සිටි අතර මා වෙතද එවැනි පාරිතෝෂිකයක් ලැබෙනු ඇතැයි මා විශ්වාස කල බව ප්‍රකාශ කරමි. ඒ අනුව මා සේවය කල වර්ෂ 30 ක් සඳහා මා අවසන් වරට ලැබූ මාසික වැටුප අනුව සමස්ථ සේවා කාලය සඳහා ගණන් බලනු ලබන මාස 30 ක වැටුපක් පාරිතෝෂික මුදල වශයෙන් නිත්‍යානුකූලව මට ලැබිය යුතු බව ප්‍රකාශ කරමි. එම දිවුරුම් ප්‍රකාශය පැ.1 ලෙස සලකුණු කරන ලදි.

එම දිවුරුම් ප්‍රකාශය පදනම් කරගෙන සාක්ෂිකරුගෙන් හරස් ප්‍රශ්න විමසන ලදී. හරස් ප්‍රශ්ණ වලට පිලිතුරු දෙමින් ඔහු පවසා සිටියේ තමා මෙම ආයතනයේ වසර තිහක් සේවය කොට වැඩ පරීක්ෂකවරයෙකු වශයෙන් විශ්‍රාම ගත් බවයි. තම දිවුරුම් ප්‍රකාශයේ පාරිතෝෂිකය 100% ක් (අවසන් වරට ලැබූ මාසික වැටුප X සේවය කල වසර ගණන) දෙන බවට කළමණාකාරිත්වය විසින් දැනුම්දුන් බව ප්‍රකාශ කර ඇතත් එම ප්‍රකාශය තහවුරු නොකරන ලදී. තව දුරටත් ප්‍රකාශ කරන ලද්දේ තමා සේවයට පැමිණි දිනයේ සිට සියලුම සේවකයන්ට 100%ක් පාරිතෝෂිකය ගෙවූ නිසා තමාටද 100% ක් ගෙවනු ඇතැයි විශ්වාසයක් ඇතිවූ බවයි. තමාගේ පත්වීම් ලිපියේ පාරිතෝෂිකය 100% ක් දෙන බවට සඳහනක් නැති බවද වෙනත් ලිපියකින් හෝ එසේ දැනුම්දී නොමැති බවද ආයතනය පාඩු ලබන විට පාරිතෝෂිකය ගෙවන්න බැහැ කියලා දැනුම්දී නොමැති බවද ප්‍රකාශ කරන ලදී.

පලමු පාර්ශ්වයේ ඉල්ලුම්කරුවන් 11 දෙනා වෙනුවෙන් දිවුරුම් ප්‍රකාශ 11 ක් පැ.1 සිට පැ. 11 දක්වා ලේඛණ වශයෙන් සලකුණු කරන ලදී.

දෙවැනි සාක්ෂිකරු වූ ජයසූරිය ආරච්චිගේ බෙනඩික්ට් සේරම් පැ2 ලෙස සලකුණු කරන ලද දිවුරුම් ප්‍රකාශය මත හරස් ප්‍රශ්න වලට

පිලිතුරු ලබා දෙමින් පහත පරිදි ප්‍රකාශ කරන ලදී. තමා සේවයට බැඳුන දිනය 1991.02.15 වේ. සේවා කාලය වසර 28 කි. තම පත්වීම් ලිපියේ පාරිතෝෂික දීමනා ගැන සඳහන් වී නැත. සැම සේවකයෙකුටම සේවයෙන් විශ්‍රාම ගන්නා විට 100% පාරිතෝෂික දීමනාවක් ගෙවුවා. මම අස්වෙද්දී කිව්වා චෙක්පත භාරගන්න බැහැ කියලා. ෆොන්සේකා මහත්තයා කිවුවා දැනට අධිකරණයේ තියෙන නඩුව ඉවර වුනාම ගෙවනවා කියලා. මම ඒ ටික ලිව්වා. ලියලා අත්සන් කරලා චෙක්පත භාරගත්තා. කළමනාකාරිත්වය ලිඛිතව දුන්නේ නැති බවත් වාචිකව ප්‍රකාශ කරන ලද බවත් කියා සිටී. තමාට ලැබිය යුතු පාරිතෝෂික මුදලින් 50% ක් ලැබුන බවත් ඉතිරි 50% මුදල ඉල්ලා සිටින බවත් ප්‍රකාශ කරයි. තමා පාරිතෝෂිකය 100%ක් ලැබෙනු ඇතැයි බලාපොරොත්තුවෙන් සිටි බවත් ප්‍රකාශ කරයි. අධිකරණයේ පැවති නඩුවේ තීන්දුව අනුව එම නඩුවේ පැමිණිලි කරුවන්ට 100% පාරිතෝෂිකය ගෙවන බව තමා දන්නා බවද කියයි.

තුන්වැනි සාක්ෂිකරු වූ පන්ගි කංකානම්ගේ ප්‍රියන්ත සුරසේන පැ.3 ලෙස සලකුණු කරන ලද දිවුරුම් ප්‍රකාශය මත හරස් ප්‍රශ්නවලට පිලිතුරු ලබා දෙමින් පහත පරිදි ප්‍රකාශ කරන ලදී. තමා සේවයට බැඳුන දිනය 1980.06.10 වේ. සේවා කාලය වසර 38 කි. තම පත්වීම් ලිපියේ පාරිතෝෂික දීමනා ගැන සඳහන් වී නැත. සැම සේවකයෙකුටම සේවයෙන් විශ්‍රාම ගන්නා විට 100% පාරිතෝෂික දීමනාවක් ගෙවුවා. මට ගෙවන ලද්දේ 50% වශයෙන් ගණන් බලන ලද මුදල වන රුපියල් 985,340/= පමණයි. මම යනකොටත් නඩුව තිබුනා. ෆොන්සේකා මහත්තයා කිවුවා දැනට අධිකරණයේ තියෙන නඩුව ඉවර වුනාම ගෙවනවා කියලා. මම ඒ ටික ලිව්වා. අත්සන් කරලා චෙක්පත භාරගත්තා. කළමණාකාරීත්වය ලිඛිතව දුන්නේ නැහැ. වාචිකව තමයි ප්‍රකාශ කරන ලද්දේ. තමාට ලැබිය යුතු පාරිතෝෂික මුදලින් 50% ක් ලැබුන බවත් ඉතිරි 50% මුදල ඉල්ලා සිටින බවත් ප්‍රකාශ කරයි. තමා පාරිතෝෂිකය 100% ක් ලැබෙනු ඇතැයි බලාපොරොත්තුවෙන් සිටි බවත් ප්‍රකාශ කරයි. අධිකරණයේ පැවති නඩුවේ තීන්දුව අනුව එම නඩුවේ පැමිණිලිකරුවන්ට 100% පාරිතෝෂිකය ගෙවන බව තමා දන්නා බව ද කියා සිටී.

4.කොට්ටාව ගමගේ උදය ප්‍රියන්ත කුමාර
5. අලුත්ගේ වසන්ත උපනන්ද
6. ඉඳැල්ල ආරච්චිගේ උදයංග ඉන්ද්‍රජිත් අමරසේන
7. ඌවගේදොන් සනී ස්ටැන්ලි
8. එස්. බී. එම්. සරත් කුමාරසිංහ
9.ගාර්ඩියහේවාගේ සරත් කුමාර
10.උලුවඩුගේ සරත් කුමාර

යන සාක්ෂිකරුවන් දස දෙනෙක් පලමු පාර්ශ්වය වෙනුවෙන් සාක්ෂි ලබාදෙන ලදී. එකී සාක්ෂිකරුවන් සියලු දෙනාගෙන් ඉදිරිපත් වූ කරුණු බොහෝ දුරට සමාන ස්වභාවයක් තිබේ.

දෙවන පාර්ශ්වය වෙනුවෙන් සාක්ෂිකරුවන් තිදෙනෙකු සාක්ෂි ලබාදී ඇත. පලමු සාක්ෂිකාරිය පිරිස් කළමනාකාරිනිය වන චන්ද්‍රා මැටිල්ඩා ගුණසේකර යන අයයි. 1990 වර්ෂයේ සිට පාරිතෝෂික දීමනාවට අදාළ ලේඛන හැඳුවේ මමයි. පනත අනුව ලබාදිය යුතු පාරිතෝෂිකය 50% ට අමතරව තවත් 50% ක් වැඩිපුර ලබාදීම 2016 වර්ෂයෙන් පසුව නැවැත්තුවා.කළමණාකරන තීරණ ගැනීමට මම සම්බන්ධ නැහැ. මැනේජ්මන්ට් එකේ මිස්ට වෙල්ගම මට ඒ විදියට උපදෙස් දුන්නා. මෙම පැමිණිලිකරුවන් කිසිම කෙනෙක් මා සමග පාරිතෝෂික දීමනාව ගැන කථා කරලා නැහැ. ගාර්ඩිය හේවාගේ සරත් කුමාර යන අයට මම කිසිම අවස්ථාවක පොරොන්දුවක් දීලා නැහැ පාරිතෝෂික දීමනාව 100% ක් ලබා දෙන බවට උපාලි පුවත්පත් සමාගමේ වෙනත් සේවක පිරිසක් පාරිතෝෂික දීමනාව සම්බන්ධයෙන් නඩුවක් දමලා ඒ නඩුවේ තීන්දුව අනුව පාරිතෝෂික දීමනාව 100% ලබාගන්න බව මම දන්නවා.

දෙවන පාර්ශ්වයේ දෙවන සාක්ෂිකරු වශයෙන් සමූහ කළමණාකරු මානව සම්පත් නෙරංජන් ෆොන්සේකා යන අය කැඳවයි. සාක්ෂිකරු උපාලි පුවත් පත් ආයතනයේ වසර 40 ක් සේවය කර ඇත. පාරිතෝෂික පනත අනුව සේවකයින්ට ගෙවිය යුතු සියලු දීමනා සේවකයන්ට ලබා දුන් බවත් ඊට අමතරව Ex Gracia දීමනාවක් ලබාදුන් බවත් එම Ex Gracia දීමනාව 1976 වසරේ සිට නවත්වා ඇති බවත් කියා සිටී. අධ්‍යක්ෂ මණ්ඩලයේ තීරණයක් අනුව Ex Gracia දීමනාව ගෙවීම නවත්වන ලදී. පාරිතෝෂික මුදල ගෙවීම සම්බන්ධයෙන් හෝ Ex Gracia මුදල ගෙවීම සම්බන්ධයෙන් සේවකයින්ගේ පත්වීම් ලිපියේ සඳහනක් නැත. පනතේ 10(1) වගන්තිය යටතේ වැඩිපුර මුදලක් ගෙවන්න පුලුවන් කියලා දන්නවා. නමුත් අපි 2016 දක්වා ගෙව්වේ Ex Gracia මුදලක් විදියටයි. උපාලි පුවත්පත් සමාගමේ සේවකයන් පිරිසක් 10 වගන්තිය අනුව පාරිතෝෂික ගෙව්වේ නැහැ කියලා පැමිණිල්ලක් දමලා මෙම බේරුම්කරණ අධිකරණයේ විභාගයක් කල බව දන්නවා. එම නඩුවේ තීන්දුව අනුව එම සේවකයන්ට දැන් සම්පූර්ණ පාරිතෝෂික මුදල ගෙවනවා. Ex Gracia

දීමනාව බෝනස් මුදලක් වගේ දීමනාවක්. දැන් ආයතනයට දරා ගැනීමේ හැකියාවක් නැති නිසා එය ගෙවීම නතර කලා. දැන් උපාලි පුවත්පත් ආයතනය ඉතාමත් දුර්වල තත්වයකයි තියෙන්නේ, ආදායම අඩුවෙලා, ඒ නිසා සේවකයින් 50% පමණ අඩු කරලා Dying Business එකක විදියටයි පවත්වාගෙන යන්නේ.

දෙවන පාර්ශ්වයේ තුන්වන සාක්ෂිකරු වශයෙන් ගිනුම් කළමණාකරු කණිෂ්ක රෙහාන් වික්‍රමනායක කැඳවන ලදී. 2014 වර්ෂයේ සිට උපාලි පුවත් පත් සමාගමේ වැඩ කරනවා ගිනුම් කළමණාකරු ලෙස 2020 වසරේ සිට වැඩ කරනවා. සමාගම 2010 වසරේ සිට දිගටම පාඩු ලබන ව්‍යාපාරයක්. අර්නස්ට් ඇන්ඩ් යං සමාගම විසින් විගනණය කරන ලද වාර්තා අනුව 2010 වර්ෂයේ අලාභය මිලියන 28 කි. 2011 වර්ෂයේ අලාභය මිලියන 39.9කි. 2012 වර්ෂයේ අලාභය මිලියන 65.1 කි. 2013 වර්ෂයේ අලාභය මිලියන 118.3 කි. 2014 වර්ෂයේ අලාභය මිලියන 117.6 කි. 2015 වර්ෂයේ අලාභය මිලියන 61.2 කි. 2016 වර්ෂයේ අලාභය මිලියන 2.4 කි. මේ විදියට දිගටම අලාභ ලබමින් තමයි සමාගම පවත්වා ගෙන යන්නේ. උපාලි පුවත්පත් ආයතනයේ නිර්මාතෘ උපාලි විජේවර්ධන මහතා තමයි පාරිතෝෂික දීමනාව මාස භාගයක මුදල වෙනුවට මාසයක වැටුප සේවා කාලයෙන් වැඩිකරලා  ගෙවීම් කළේ, මේ විදියේ පාරිතෝෂික ගෙවීමට අදාල නඩුවක් මීට පෙර තිබුනා. ඒ නඩුවේ තීන්දුව අනුව එම සේවකයන්ට සම්පූර්ණ මුදල ( මාසයක වැටුප X සේවා කාලය) ගෙවාගෙන යනවා. කම්කරු නීතියට අනුව ගෙවිය යුතු මුදල 50% වුනත් ආයතනය ප්‍රතිපත්තියක් වශයෙන් පෙර වර්ෂ වල සිට 100% ක් ගෙවීම කරගෙන ආවත් දැන් තියෙන තත්ත්වය අනුව අමාරු තත්වය නිසා 50% ගෙවන්න තීරණය කරලා තියෙනවා. සේවක සංඛ්‍යාවත් අඩු කරලා තියෙන්නේ. සමාගම එක පාරටම වහලා දාන්න බැහැ. එහෙම කලොත් නීති ප්‍රශ්ණ මතු වෙනවා.

උපාලි නිවුස්පේපර්ස් ප්‍රයිවට් ලිමිටඩ් ආයතනය ආරම්භ කරන ලද උපාලි විජේවර්ධන මහතා විසින් තම සේවකයින්ට පාරිතෝෂික මුදල් ගෙවීම කරන ලද්දේ (අවසන් වරට ලබාගත් මාසික වැටුප X සේවය කල වසර ගණන) ආකාරයටය. 2016 වසර දක්වා අඛණ්ඩව එම ආකාරයට පාරිෂතෝෂික මුදල් ගෙවීම සිදුකර ඇත. 2016 වර්ෂයේදී අධ්‍යක්ෂ මණ්ඩල තීරණයක් අනුව (අවසන් වරට ලබාගත් මාසික වැටුපෙන් 50%X සේවය කල වසර ගණන) ආකාරයට ගණන් බලා පාරිතෝෂික මුදල් ගෙවීමේ ක්‍රමය ආරම්භ කරන ලදී. දෙවන පාර්ශ්වය ප්‍රකාශ කරනුයේ තමන් පාරිතෝෂික දීමනා පනතේ 5 වැනි වගන්තියේ ප්‍රකාර නිවැරදිව (අවසාන වරට ලබාගත් මාසික වැටුපෙන් 1/2X සේවය කල වසර ගණන) පාරිතෝෂික මුදල් ගෙවා ඇති බවයි. එසේම 50% වැඩිපුර ගෙවන බවට කිසිදු ලිඛිත පොරොන්දුවක් හෝ සාමූහික ගිවිසුමක් නොමැති බවය. ඊට අමතරව තවත් 50% ක් ගෙවන ලද්දේ හිතේෂීභාවය (ex gracia) දීමනාවක් වශයෙන් බවය.

උපාලි පුවත්පත් සමාගම ආරම්භ කල දින සිට සේවකයින්ට පාරිතෝෂිකය ගෙවා ඇත්තේ (අවසන් වරට ලබාගත් මාසික වැටුපෙන් 50% X සේවය කල වසර ගණන) 100% වශයෙනි. එය කොටස් දෙකක් ලෙස (පනතේ විධිවිධාන අනුව ගෙවි යුතු පාරිතෝෂික මුදල + ex gracia දීමනාව) ගෙවූ බවක් හෝ සමාගමේ පොත් පත්වල සටහන්ව ඇති බවට කිසිදු සාක්ෂියක් ඉදිරිපත් නොකරන ලදී. සමාගම තම ක්‍රියාකාරිත්වය මගින් වඩා වාසිදායක පාරිතෝෂිකයක් ගෙවීම පරිචයක් ලෙස පිලිගෙන ඇත. පැමිණිලිකාර සේවකයින් වෙනත් සේවකයින්ට 100% පාරිතෝෂිකය ගෙවන ආකාරය පිලිබඳව දැන සිටි බවත් තමන්ටද ඒ අනුව ලැබෙනු ඇතැයි විශ්වාස කල බවටත් සාක්ෂි ඉදිරිපත් කරන ලදී.

විශ්‍රාම ලබන අවස්ථාවේදී තමන්ට වැඩි වාසිදායක පාරිතෝෂිකයක් ලැබෙනු ඇත යන නීත්‍යානුකූල අපේක්ෂාව (Legitimate Expectation) වග උත්තරකරු තම ක්‍රියාකාරිත්වය මගින් සේවකයින්ට ලබා දී ඇති බව තීරණය කරමි. වසර 28 - 38 අතර කාල පරාසයක් සමාගමේ සේවය කල මෙම සේවකයින්ට ලැබෙන පාරිතෝෂිකය සමාගමේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අඩු කිරීම සිදුකර ඇත්තේ සේවකයින්ගේ පාර්ශ්වයෙන් සිදු වූ වරදක් නිසා නොවේ. හේතුව වශයෙන් දක්වා ඇත්තේ සමාගම දිගින් දිගටම පාඩු ලැබීමයි. සමාගම පාඩු ලැබීම කළමණාකරණ දෝශයක් විය හැකිය.

එකම ආයතනයක දීර්ඝ කාලයක් එක්ව සේවය කල සේවකයින් අතරින් එක් පිරිසකට වඩා වාසිදායක පාරිතෝෂික මුදලක් ලබා දීමත් තවත් පිරිසකට අවාසිදායක පාරිතෝෂිකයක් ලබාදීමත් මගින් සේවකයින් වෙනස්කොට සැලකීමකට (Discrimination) ලක්කර ඇති බව තීරණය කරමි.

ඉහත සඳහන් සියලු කරුණු සලකා බලා ඉල්ලුම්කරුවන් එකොලොස් දෙනාට ඔවුන් අවසන්වරට ලැබූ මාසික වැටුප සේවය කල වසර ගණනින් වැඩිකර ලැබෙන මුදල පාරිතෝෂිකය වශයෙන් ලැබිය යුතු බවට මම තීරණය කරමි.

තවද මෙම පාරිතෝෂික මුදල ගෙවීම නියමිත දිනට මාස 12 කට වැඩි කාලයක් ප්‍රමාද වී ඇති බැවින් 1992 අංක 62 දරන පාරිතෝෂික ගෙවීම සංශෝධන පනතේ සඳහන් පරිදි 30%ක අධිභාරයක්ද හිමිවිය යුතු බව තීරණය කරමි.

ඒ අනුව ඉල්ලුම්කරුවන් එකොලොස් දෙනාට පහත දක්වා ඇති පරිදි හිඟ පාරිතෝෂික මුදල් සහ අධිභාරය ද ප්‍රදානය කරමි.
තවද මෙම බේරුම්කරණ ක්‍රියාවලිය විමසීමට ගත් අතරවාරයේදී සමරවීර ආරච්චිගේ බංදුල සමරවීර යන අය මියගොස් ඇති බවට ඔහුගේ මරණ සහතිකය බේරුම්කරණයට ඉදිරිපත් කරන ලදී. ඒ අනුව ඔහුට හිමි සියලු දීමනා ඔහුගේ උරුමකරුවන්ට නිසි පරිදි බෙදී යා යුතු බව ද තීරණය කරමි.

තවද මෙම ප්‍රදානය ගැසට් පත්‍රයේ පලවී මාස දෙකක් ඇතුලත සම්පූර්ණ මුදල වන රුපියල් 10,342,911.80 (එක්කෝටි තුන් ලක්ෂ හතලිස් දෙදහස් නවසිය එකොළහයි ශත අසූව) මුදල උතුරු කොළඹ සහකාර කම්කරු කොමසාරිස් වෙත තැන්පත් කල යුතු බවට දෙවන පාර්ශ්වයට නියම කරමි.

| *අනු අංකය* | *නම* | *ලැබිය යුතු හිඟ පාරිතෝෂික මුදල* | *අධිභාරය 30%* | *මුලු මුදල* |
|---|---|---|---|---|
| 1 | ජී. එල්.එන්.වීරසිරි. | 563,775.00 | 169,132.50 | 732,907.50 |
| 2 | පී.කේ. ප්‍රියන්ත සුරසේන | 985,340.00 | 295,602.00 | 1,280,942.00 |
| 3 | ජේ. ඒ. යූ. බී. සේරම් | 567,480.00 | 170,244.00 | 737,724.00 |
| 4 | එස්. ඒ. බී. සමරවීර | 878,760.00 | 263,628.00 | 1,142,388.00 |
| 5 | යූ. සරත් කුමාර. | 790,245.00 | 237,073.50 | 1,027,318.50 |
| 6 | යූ.ඩී. සනී ස්ටැන්ලි | 834,137.00 | 250,241.10 | 1,084,378.10 |
| 7 | එච්. ඒ. යූ. අයි. අමරසේන | 645,520.00 | 193,656.00 | 839,176.00 |
| 8 | එස්. බී. වයි. එස්. කුමාරසිංහ | 686,000.00 | 205,800.00 | 891,800.00 |
| 9 | අළුත්ගේ වසන්ත උපනන්ද | 644,240.00 | 193,272.00 | 837,512.00 |
| 10 | ජී.සරත් කුමාර | 620,812.00 | 186,243.60 | 807,055.60 |
| 11 | කේ. ජී. යූ. පී. කුමාර | 739,777.00 | 221,933.10 | 961,710.10 |
| | එකතුව | 7,956,086.00 | 2,386,825.80 | 10,342,911.80 |

මෙම ප්‍රදානය සාධාරණ සහ යුක්ති සහගත ප්‍රදානයක් බව සහතික කරමි.

නීතිඥ **ආර්. ඒ. තිලකරත්න,**
**බේරුම්කරු.**

2025 අගෝස්තු මස 07 වැනි දින.

EOG 09-0204

---

මගේ අංකය. IR/COM/03/2020/271/(1).

**කාර්මික ආරාවුල් පනත 131 වන අධිකාරය**

131 වන අධිකාරය වන සංශෝධිත කාර්මික ආරාවුල් පනතේ 4(1) වගන්තිය යටතේ 2025.07.21 දිනැති හා අංක 2446/32 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *අති විශෙෂ ගැසට් පත්‍රයේ* ප්‍රසිද්ධ කරන ලද 2025.07.03 දින දරන නියෝගයෙන්, එක්

පාර්ශ්වයක් වශයෙන් අතුරුගිරිය, ඕරුවල, අංක 74/5/4 ලිපිනයෙහි පදිංචි පී.ඩී. ඊ. පෙරේරා මිය සහ කොළඹ 02, ශ්‍රීමත් චිත්තම්පලම් ඒ. ගාඩිනර් මාවත, අංක 34 ලිපිනයෙහි පිහිටි ජාතික නිවාස සංවර්ධන අධිකාරිය අතර පවත්නා කාර්මික ආරාවුල බේරුම් කිරීමෙන් සමථයකට පත් කිරීම සඳහා යොමු කරන ලදුව, බේරුම්කරු විසින් මා වෙත එවා ඇති අංක A/46/2025 හා 2025.08.21 දිනැති ප්‍රදානය එම පනතේ 18(1) වගන්තිය යටතේ මෙයින් ප්‍රකාශයට පත් කරනු ලැබේ.

**එච්. එම්. ඩී. එන්.කේ.වටලියද්ද,**
කම්කරු කොමසාරිස් ජනරාල්.

2025 සැප්තැම්බර් මස 11 වැනි දින.
කම්කරු දෙපාර්තමේන්තුව
කොළඹ 05.

බේරුම්කරණ හා කාර්මික අධිකරණ ශාඛාවේදී ය

ගොනු අංකය: IR/COM/03/2020/271 (1)
නඩු අංකය: A/46/2025

පළමු පාර්ශ්වය වෙනුවෙන් පෙනී සිටීම
නියෝජනයක් නැත

පී.ඩී.ඊ.පෙරේරා මිය
අංක 74/5/4
ඕරුවල
අතුරුගිරිය

*පළමු පාර්ශ්වය*

වෙනුවෙන් පෙනී සිටීම

දෙවන පාර්ශ්වය වෙනුවෙන් පෙනී සිටීම
නීති නිලධාරි ප්‍රසාංගිකා මධුෂානි විජේමාන්න
නියෝජ්‍ය සාමාන්‍යාධිකාරි කළමනාකරණ සහ පාලන
ලලිත් එදිරිසිංහ මහතා
සහකාර සාමාන්‍යාධිකාරි මානව සම්පත් හා පරිපාලන
වසන්තා ජයවර්ධන මිය
කළමනාකරණ සහකාර සුරංජලී නිරෝෂණී මිය
නීතිඥ හිමාෂා විදානගමගේ මෙනෙවිය

ජාතික නිවාස සංවර්ධන අධිකාරිය
අංක 34, ශ්‍රීමත් චිත්තම්පලම් ඒ ගාඩිනර් මාවත
කොළඹ 02

*දෙවන පාර්ශ්වය*

**ප්‍රදානය**

කම්කරු අමාත්‍ය ගරු ආචාර්යය අනිල් ජයන්ත ප්‍රනාන්දු මහතා විසින් 1957 අංක 14 හා 1957 අංක 62 හා 1962 අංක 04 හා 1968 අංක 39 (1968 අංක 37 දරන කාර්මික ආරාවුල් (විශේෂ ප්‍රතිපාදන) පනත සමග කියවා) දරන පනත් වලින් සංශෝධිත වූ ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත් වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනතේ 4 (1) වගන්තියෙන් ගරු අමාත්‍යතුමා වෙත පැවරී ඇති බලතල අනුව 2025.07.03 දින දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජන රජයේ *අති විශෙෂ ගැසට් පත්‍රය* අනුව ඒ. බී. හේරත් වන මා බේරුම්කරු වශයෙන් පත්කොට මා වෙත යොමු කර ඇත.

**ආරාවුලට තුඩුදුන් කාරණය**

බේරුම්කරණය සඳහා මා වෙත යොමු කර ඇති උක්ත නියෝගය ප්‍රකාරව පහත සඳහන් දෙපාර්ශ්වය අතර උද්ගතව ඇති කාර්මික ආරාවුලයි.

මෙම ආරාවුලට හේතු වී ඇති කාරණය ලෙස සහකාර කම්කරු කොමසාරිස් ජනරාල් එච්. එම්. ඩී. එන්. කේ. වටලියද්ද මහත්මිය විසින් නිකුත් කරන ලද ඇයගේ අංක IR/COM/03/2020/271 (1) හා 2025.06.18 දිනැති ලිපිය අනුව " ජාතික නිවාස සංවර්ධන අධිකාරියේ සේවය කරනු ලබන පී.ඩී. ඊ. පෙරේරා මියට කළමනාකරණ සේවා චක්‍රලේඛ අංක 30හි විධිවිධාන ප්‍රකාරව ප්‍රතිව්‍යුහගත කිරීමේදී ඇයට තනතුරු නාමය පමණක් ලබා දී අදාල දීමනා කිසිවක් ලබා නොදීමෙන් අසාධාරණයක් සිදුව ඇත්ද, එසේ අසාධාරණයක් සිදුව ඇත්නම් ඇයට හිමි විය යුතු සහන කවරේද" යන්නත් පිළිබඳව වේ.

පහත සඳහන් දිනයන් යටතේ නඩු අංක A/46/2025 දින බේරුම්කරණ අංශයට දෙපාර්ශ්වයම කැඳවා විභාග පවත්වා ඇත.

2025.07.29

2025.08.13

**බේරුම්කරණ විභාගයේ පසුබිම හා එය පැවැත්වූ ආකාරය**

මෙම නඩුව A/46/2025 යටතේ 2025.07.29 හා 2025.08.13 පවත්වන ලද බේරුම්කරණ විභාගයන් සඳහා ඉල්ලුම්කරු බේරුම්කරණ අංශයට නොපැමිණි බව පෙනී යයි. දෙවන පාර්ශ්වය පමණක් ඉහත දින දෙකේම නඩු විභාගයන් සඳහා පෙනී සිට ඇති අතර දෙවන පාර්ශ්වය පමණක් පළමු විස්තර ප්‍රකාශය හා ඇමුණුම් ඉදිරිපත් කර ඇත.

**ප්‍රදානය**

ඉහත කාරණා හේතුවෙන් කාර්මික නීතියේ ඉහලින්ම පිළිගැනෙන යුක්ති සහගත සහ සාධාරණ නිගමනයන් වශයෙන් ඉල්ලුම්කරු වන පී.ඩී.ඊ. පෙරේරා මහත්මිය බේරුම්කරණය සඳහා බේරුම්කරණ හා කාර්මික අධිකරණ ශාඛාවට ඉදිරිපත් නොවන බැවින් ඉල්ලුම්කරුගේ ඉල්ලීම නිෂ්ප්‍රභා කිරීමට තීරණය කල බව මෙයින් දැනුම් දෙමි.
මෙය සාධාරණ සහ යුක්ති සහගත ප්‍රදානයක් බව තීරණය කරමි.

**ඒ.බී.හේරත්,**
**බේරුම්කරු**

2025 අගෝස්තු මස 21 වැනි දින .
බේරුම්කරණ හා කාර්මික අධිකරණ ශාඛාවේදී ය.

EOG 09-0205

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.